# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1715/30 - 2011 ජූලි 22 වැනි සිකුරාදා - 2011.07.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

ව්‍යවස්ථාපිත නිශ්චය අංක : 3596
විශේෂ අංකය : මහ/589
සංශෝධිත අංක : 566

**1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ පළවූ ව්‍යවස්ථාපිත නිශ්චය අංක 3596 සංශෝධනය කිරීම**

1979 දෙසැම්බර් මස 06 වැනි දාතම සහ අංක 52/5 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ව්‍යවස්ථාපිත නිශ්චය අංක 3596 යටතේ පලකරන ලද ව්‍යවස්ථාපිත නිශ්චය අවලංගු කර පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් මහනුවර කොළඹ වීදියේ, අංක 38 දරන ස්ථානයේ පදිංචිව සිට දැනට මියගොස් ඇති කට්ටන්ඩි දේවගේ නන්දසිරිල් ප්‍රේමරත්න මහතාගේ බූදලය සම්බන්ධයෙන් මහනුවර දිසා අධිකරණයේ විභාග වූ අංක 13/2004 දරන නඩුවේ අවසාන තීන්දු ප්‍රකාශයේ දැක්වෙන පරිදි කටයුතු කිරීම සඳහා මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2011 ජූලි මස 20 වැනි දින,
අංක සී 82,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

උපලේඛනය

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මාදුරේ කෝරළේ, සුළු කොට්ඨාශයේ, පොල්ගොල්ල යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අතිරේක අංක 1 අවසාන ගම් පිඹුරු අංක 2623හි වුඩ්ස්ලි එස්ටේට් නමැති ඉඩමේ නොබෙදූ අක්කර 27, රූඩ් 1, පර්චස් 00 ප්‍රමාණය ඇති කැබලි අංක 167 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

1A - G 14824— 345 (2011/07)

උපලේඛනය (සම්බන්ධිතයි)

02. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මාදුරේ කෝරළේ, සුළු කොට්ඨාශයේ, පාරාගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අතිරේක අංක 3 අවසාන ගම් පිඹුරු අංක 822හි වූඩ්ස්ලි එස්ටේට් නමැති ඉඩමේ නොබෙදූ අක්කර 23, රූඩ් 0, පර්චස් 02.4ක ප්‍රමාණය ඇති කැබලි අංක 446 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

03. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, රිදීගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මාදුරේ කෝරළේ, සුළු කොට්ඨාශයේ, පාරාගොඩ ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු අංක 822හි වූඩ්ස්ලි එස්ටේට් නමැති ඉඩමේ නොබෙදූ අක්කර 00, රූඩ් 3, පර්චස් 09.6ක ප්‍රමාණය ඇති කැබලි අංක 220 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද වේ.

08-211/1

---

ව්‍යවස්ථාපිත නිශ්චය අංක : 4616
විශේෂ අංකය : ර/178

## 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 19 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත නිශ්චය

කලවාන, සොමිකඳුර වත්ත ලිපිනය දී ඇති ධර්මදාස නලින කීර්ති වැලිකල මහතා විසින් පනතේ 18 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත ප්‍රකාශනයක් කරන ලද අතර, මේ වන විට ඔහු මියගොස් ඇති බැවින් පනතේ 19 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල අනුව මෙම කොමිෂන් සභාව විසින් ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට අයිතිය තිබූ කෘෂිකාර්මික ඉඩම් වලින් ඔහුට තබා ගැනීමට ඉඩදිය යුතු කොටස නිශ්චය කරමින් ඔහුගේ බූදලයට ව්‍යවස්ථාපිත නිශ්චයක් කරන ලදී. එසේ ව්‍යවස්ථාපිත බදු ගැණුම්කරුට තබා ගැනීමට ඉඩදෙන ලද කෘෂිකාර්මික ඉඩම් කොටස් මෙහි පහත උපලේඛනයෙහි දැක්වේ

නිමල් ජී. පුංචිහේවා,
සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

2011 ජූලි මස 20 වැනි දින,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
ග්‍රෙගරි පාර,
කොළඹ 07.

උපලේඛනය

01. සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුලු කෝරලයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මැද පත්තුව සුළු කොට්ඨාශයේ, පේඩිකන්ද යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු 243 අතිරේක අංක 04 හි දැක්වෙන කලුවල තැන්නේ හේන නමැති ඉඩමේ අක්කර 16, රූඩ් 0, පර්චස් 35ක ප්‍රමාණය ඇති කැබලි අංක 285, 286 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

02. සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුලු කෝරලයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මැද පත්තුව සුළු කොට්ඨාශයේ, පේඩිකන්ද යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු 243 අතිරේක අංක 05 හි දැක්වෙන සොමිකඳුර වත්ත නමැති ඉඩමේ අක්කර 26, රූඩ් 2, පර්චස් 00ක ප්‍රමාණය ඇති කැබලි අංක 287 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

උපලේඛනය (සම්බන්ධිතයි)

03. සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුලු කෝරලයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මැද පත්තුව සුළු කොට්ඨාශයේ, කලවාන යන ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද අවසාන ගම් පිඹුරු 244 අතිරේක අංක 03හි දැක්වෙන අඹගළු ඇල්ලේගොඩ නමැති ඉඩමේ අක්කර 06, රූඩ් 0, පර්චස් 19ක ප්‍රමාණය ඇති කැබලි අංක 447 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

04. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මැද පත්තුවේ, සුළු කොට්ඨාශයේ හොරගල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු කො/1791හි දැක්වෙන මොරන්දුගල විල කුඹුර නමැති ඉඩමේ අක්කර 00, රූඩ් 3, පර්චස් 29ක ප්‍රමාණය ඇති කැබලි අංක 01 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද,

05. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හංවැල්ල ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයේ, මැද පත්තුවේ, සුළු කොට්ඨාශයේ හොරගල ගමේ පිහිටි සර්වේ ජනරාල් විසින් අඳින ලද මූලික පිඹුරු 1792හි දැක්වෙන පොළොන් කනත්ත නමැති ඉඩමේ අක්කර 0, රූඩ් 3, පර්චස් 16ක ප්‍රමාණය ඇති කැබලි අංක 01 දරන බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ද වේ.

08-211/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.